# රාජකීය විද්‍යාලය කොළඹ 07
# Royal College – Colombo 07

13 වන ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය 2010 ජුනි
**Grade 13 – Final Term Test June 2010**

කාලය පැය 01

## ආර්ථික විද්‍යාව I – I කොටස

**උපදෙස් :**
*** පළමුවන කොටසට අදාල පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**
*** සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 බැගින් ලකුණු 40ක් හිමිවේ.**

1. ආර්ථික විද්‍යාවේ යථානුරූපී ප්‍රකාශ සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
   i. යථානුරූපී ප්‍රකාශයක් නිවැරදි විය යුතුය.
   ii. යථානුරූපී ප්‍රකාශයක් ප්‍රත්‍යක්ෂ මූලික කරුණු මගින් පරීක්ෂාවට ලක් කළ නොහැකිය.
   iii. යථානුරූපී ප්‍රකාශ විද්‍යාත්මක ස්වරූපයක් ගනී.
   iv. යථානුරූපී ප්‍රකාශ ආර්ථික හැසිරීම් හා සංසිද්ධි පැහැදිලි කිරීමට යොදා නොගනී.
   v. ආර්ථික ප්‍රතිපත්ති, යථානුරූපී ප්‍රතිපත්ති මත පදනම් වේ.

2. වැඩිවන ආවස්ථික පිරිවැයක් ඇතිවීමට බලපාන ප්‍රධාන සාධකය වනුයේ,
   i. නිෂ්පාදන සාධක වල සුවිශේෂිතාවය
   ii. සම්පත් වල හිඟකම
   iii. නිෂ්පාදන සාධක සමජාතීය වීම
   iv. සාධක මිල ගණන් වෙනස් වීම
   v. මිනිස් වුවමනා අසීමිත වීම

3. ප්‍රාග්ධනය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත පරිදිය. එහි නිවැරදි ප්‍රකාශය වනුයේ,
   i. රටක් අලුතින් ප්‍රාග්ධනය එක් කිරීම ආයෝජනයකි.
   ii. ප්‍රාග්ධනය යනු මූල්‍ය සංකල්පයකි.
   iii. ප්‍රාග්ධන සම්පත් නිරායාසයෙන්ම බිහිවේ
   iv. ප්‍රාග්ධනය හා ඵලදායිතාව අතර සම්බන්ධයක් නැත
   v. කාරක ප්‍රාග්ධනයට ඇතුලත් වන්නේ ගබඩා වල ඇති අමුද්‍රව්‍ය පමණි

4. ආර්ථික කාර්යක්ෂමතාවය ලගා කර ගැනීමට නම්,
   i. නිෂ්පාදන කාර්යක්ෂමතාව අත්කර ගත යුතුයි.
   ii. පූර්ණ සේවා නියුක්තිය අත්කර ගත යුතුයි.
   iii. සම්පත් බෙදා හැරීමේ කාර්යක්ෂමතා අත්කර ගත යුතුයි.
   iv. සමාජ වරණය උපරිම කරන සංයෝග ලක්ෂ්‍යය නි.හැ.මා. වක්‍රය මතින් තෝරා ගෙන එම ලක්ෂ්‍යය මත නිෂ්පාදනය කළ යුතුය.
   v. පූර්ණ සේවා නියුක්තියක් සහ අකාර්යක්ෂම සම්පත් බෙදා හැරීමක් අත්කර ගත යුතුය.

5. සම්ප්‍රදායික ආර්ථික පද්ධතියක ලක්ෂණයකි,
   i. දේපල පිළිබඳ පෞද්ගලික හිමිකම
   ii. නිදහස් ව්‍යවසාය හා නිදහස් තේරීම
   iii. අනම්‍යශීලී බව
   iv. රජයේ කාර්යය භාරය සීමිත වීම
   v. ශ්‍රමය හැරුණු විට සියලු නිෂ්පාදන සාධක රජය සතු වීම

6. සමාජීය වෙළඳ පොළ ආර්ථිකයක් යනු
   i. සමාජවාදී වෙළෙඳ පොළ ආර්ථිකයකි
   ii. ධනවාදී වෙළෙඳ පොළ ආර්ථිකයකි.
   iii. මිශ්‍ර ආර්ථිකයකි
   iv. සමාජ සාධාරණත්වය යොමු වූ ආර්ථිකයකි.
   v. ලිබරල් වෙළෙඳ පොළ ආර්ථිකයකි

7. Qd = 100 – 10P යන සමීකරණයට අදාලව නම්‍යතාව ගණනය කිරීමේදී $Ed = \frac{P}{P-a}$ යන මිල නම්‍යතා සූත්‍රය භාවිතා කරන්නේ නම් a හි අගය විය යුත්තේ.
   i. 100 කි
   ii. 0.1 කි
   iii. 10 කි
   iv. 20 කි
   v. 0.20 කි

8. ගිෆන් භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතර නිවැරදි ප්‍රකාශය වන්නේ,
   i. සෘණ ආදයම් ප්‍රතිවිපාක ඉතා දුර්වල වේ
   ii. ආදේශන ප්‍රතිවිපාකය සාපේක්ෂව ඉතා ප්‍රබල වේ
   iii. ආදයම් ප්‍රතිවිපාක සෘණ අගයක් ගනී.
   iv. අඩු ආදයම් ලබන අයගේ ආදයමින් සුළු කොටසක් ඒ සඳහා වැය වේ.
   v. ඉල්ලුම් නම්‍යතාවය සෘණ අගයක් ගනී.

9. පුද්ගලයකුගේ ආදයම රු. 10,000 සිට 12,000 දක්වා වැඩිවන විට X භාණ්ඩයේ ප්‍රමාණය 80 සිට 120 දක්වා වැඩිවේ. Y භාණ්ඩයේ ඒකක ප්‍රමාණය 8060 දක්වා අඩුවේ. X හා Y භාණ්ඩ පිළිබඳ නිවැරදි පිළිතුර වන්නේ,

| X | Y |
|---|---|
| i. සුඛෝපභෝගී භාණ්ඩයකි | සාමාන්‍ය භාණ්ඩයකි |
| ii. සුඛෝපභෝගී භාණ්ඩයකි | බාල භාණ්ඩයකි |
| iii. ගිෆන් භාණ්ඩයකි | සුඛෝපභෝගී භාණ්ඩයකි |
| iv. සාමාන්‍ය භාණ්ඩයකි | සුඛෝපභෝගී භාණ්ඩයකි |
| v. බාල භාණ්ඩයකි | සාමාන්‍ය භාණ්ඩයකි |

10. QS = 4+2P යන සැපයුම් සමීකරණයට අදාල සැපයුම් වක්‍රය පහත පරිදිය. A ලක්ෂ්‍යයේ හා B ලක්ෂ්‍යයේ සැපයුම් නම්‍යතාව දක්වෙන පිළිතුර වනුයේ,




| | ලක්ෂයේ නම්‍යතාවය | ලක්ෂයේ නම්‍යතාවය |
|---|---|---|
| i. | .5 | 0.67 |
| ii. | 1.0 | .5 |
| iii. | .2 | 1 |
| iv. | 1 | .2 |
| v. | .8 | .4 |

11. තරගකාරී වෙළඳ පොළක අලෙවි වන භාණ්ඩයක් සම්බන්ධව ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දක්වයි. $Qd = 16 - 2P$, $Q_s = 4+2P$ නම් මෙම භාණ්ඩය සඳහා ගැනුම්කරුවන් මත රු. 2.00 ක ඒකක බද්දක් පනවනු ලැබුවහොත් ගැනුම්කරුවන් ගෙවන මිල හා විකුණුම් කරුවාට ලැබෙන මිල වන්නේ,

| | ගැනුම්කරුවන් ගෙවන මිල | විකුණුම්කරුවන්ට ලැබෙන මිල |
|---|---|---|
| i. | 4 | 2 |
| ii. | 5 | 3 |
| iii. | 2 | 4 |
| iv. | 6 | 4 |
| v. | 2.5 | 4.5 |

12. නිෂ්පාදකයන්ට අවම සහතික මිලක් ලබාදීම සඳහා රජය කටයුතු කර ඇත. මෙම අවම සහතික මිල යටතේ මිල ආධාරක වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වේ. මෙයට අදල රූප සටහන පහත දක්වේ.
රූප සටහනට අනුව පාරිභෝගික අතිරික්තයේ වැඩිවීම හා ශුභ සාධනයේ ශුද්ධ වෙනස වනුයේ,




| | පාරිභෝගික අතිරික්තයේ වෙනස | සුභ සාධනයේ ශුද්ධ ප්‍රතිශතය |
|---|---|---|
| i. | + (B+H) | - E |
| ii. | + (A+B+C) | - H |
| iii. | + (C+ E+F) | - G |
| iv. | + (B+C) | - F |
| v. | + (C+D) | - H |

13. දිගු කාලයේදී අඩුවන පරිමාණුකූල ඵල ඇතිවීමට බලපාන හේතුවකි,
i. යන්ත්‍ර භාවිතයේ හැකියාව
ii. වරක දී පමණක් දැරීමට සිදුවන පිරිවැය
iii. සම්පත් හිඟකම
iv. නිෂ්පාදන සාධක වල පවතින අභාජ්‍යතාවය
v. ශ්‍රම විභාජනය තුලින් ලැබෙන විශේෂ ප්‍රාගුණ්‍යය

14. පූර්ණ තරගකාරී වෙළඳ පොළ ව්‍යුහයකට සහ ඒකාධිකාරී තරග වෙළඳපොල ව්‍යුහයකට අදල ආයතන සංඛ්‍යාව හා භාණ්ඩයේ ස්වභාවය පිළිවෙලින් දක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

| | ආයතන සංඛ්‍යාව/ භාණ්ඩ | ආයතන සංඛ්‍යාව/ භාණ්ඩ |
|---|---|---|
| i. | විශාලයි / සමජාතියයි | විශාලයි / ප්‍රභේදනය |
| ii. | අතිවිශාලයි / සමාජාතියයි | විශාලයි / ප්‍රභේදනය |
| iii. | කුඩා / සමජාතියයි | කුඩා ප්‍රමාණයක් / ප්‍රභේදනය |
| iv. | එකයි / සමජාතිය | කුඩා ප්‍රමාණයක් / සමජාතිය |
| v. | අතලොස්සකි, සමජාතිය | විශාල / සමජාතිය |

15. 


C = 100 + 8yd යන පරිභෝජන වක්‍රයට අදාලව අදින පරිභෝජන රේඛාව ඉහත දැක්වේ. ඉහත පරිභෝජන රේඛාවටම අනුව ආදායම වැඩිවන විට ආන්තික පරිභෝජන නැමියාව සහ සාමාන්‍ය පරිභෝජන නැමියාවට අදාල නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. ආන්තික පරිභෝජන නැමියාව ස්ථාවර වන අතර සාමාන්‍ය පරිභෝජන නැමියාව ක්‍රමයෙන් අඩුවේ.
ii. ආන්තික පරිභෝජන නැමියාව වැඩි වන අතර සාමාන්‍ය පරිභෝජන නැමියාව ක්‍රමයෙන් ස්ථාවර වේ.
iii. සාමාන්‍ය පරිභෝජන නැමියාව හා ආන්තික පරිභෝජනය ස්ථාවර වේ.
iv. සාමාන්‍ය පරිභෝජන නැමියාව ස්ථාවර වන අතර ආන්තික පරිභෝජනය නැමියාව වැඩිවේ.
v. සාමාන්‍ය පරිභෝජන නැමියාව සෘණ වන අතර ආන්තික පරිභෝජනය නැමියාව ධන වේ.

16. එක්තරා ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය C = 1000 + 0.8 yd වේ. ආන්තික බදු නැමියාව 0.2 කි. ආන්තික ආනයන නැමියාව 0.1 කි. මෙම ආර්ථිකයේ ස්වාධීන බදු ගුණකය හා ස්වාධීන ආනයන ගුණකය පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

| | | |
|---|---|---|
| i. -2 හා -3 | ii. -1.5 හා 2.75 | iii. - 1.25 හා -3.25 |
| iv. - 1.74 හා - 2.17 | v. - 1.20 හා - 2.30 | |

17. ශ්‍රී ලංකාවේ 2008 වර්ෂයේ සමස්ථ අයවැය හිඟය දළ දේශිය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස නිවැරදිව දැක්වෙන්නේ,

| | | |
|---|---|---|
| i. 7.7 | ii. 7.0 | iii. -7.2 |
| iv. -7.5 | v. 7.8 | |

18. ශ්‍රී ලංකාවේ 2008 වර්ෂයේ රාජ්‍ය ආදායම තුල බදු ආදායම සහ බදු නොවන ආදායමේ දයකත්වය පිළිවෙලින් දැක්වෙන්නේ,

| | | |
|---|---|---|
| i. 80% හා 20% | ii. 75% හා 25% | iii. 89% හා 11% |
| iv. 90% හා 10% | v. 88% හා 12% | |

19. C = 150 + 0.6 yd වන අතර Ta = 50 වේ නම් ස්වාධීන බදු ගැලපු පසු ස්වාධීන පරිභෝජනයේ අගය වන්නේ,

| | | |
|---|---|---|
| i. 100 | ii. 150 | iii. 120 |
| iv. 130 | v. 50 | |

20. ශ්‍රී ලංකාවේ 2008 වර්ෂයේ රාජ්‍ය වියදම තුළ වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් හි සාපේක්ෂ දයකත්වය දළ දේශිය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින්,

| | | |
|---|---|---|
| i. 14.2 හා 8.0 | ii. 16.2 හා 5.1 | iii. 17.1 හා 6.8 |
| iv. 12.2 හා 9.2 | v. 15.2 හා 5.7 | |

රාජකීය විදුහල කොළඹ 07

**Royal College – Colombo 07**

13 වන ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය 2010 ජුනි

**Grade 13 – Final Term Test June 2010**

කාලය පැය 01

# ආර්ථික විද්‍යාව I – II කොටස

**උපදෙස් :**

*** "අ" කොටසින් ප්‍රශ්න දෙකක් ද,**

*** "ආ" කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

## "අ" කොටස

1) i. ඕනෑම ආර්ථිකයකට තේරීමක් කිරීමට සිදුවන්නේ ඇයි දැයි සඳහන් කර, ඕනෑම ආර්ථිකයක් හමුවේ ඇති මූලික තේරීම් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. සිරස් අක්ෂයේ කිරිපිටි ද තිරස් අක්ෂයේ රෙදි ද නිෂ්පාදනය කරන වැඩෙන ආවස්ථික පිරිවැයෙන් යුත් ආර්ථිකයක් උපකල්පනය කරන්න.

ඉහත නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය උපයෝගි කරගෙන පහත සඳහන් සංසිද්ධීන් පැහැදිලි කරන්න. එක් එක් සංසිද්ධිය සඳහා වෙන වෙනම රූප සටහන් මගින් පැහැදිලි කරන්න.

අ. ඉහත සඳහන් ආර්ථිකයට පනවන ලද ආර්ථික සම්බාධක යටතේ එම රටෙන් විදේශ රටවල් මිලදී ගන්නා කිරි පිටි අත්හිටුවීම.

ආ. ආර්ථික සම්බාධක යටතේ ඉහත ආර්ථිකය ලබාදෙන යෙදවුම් හා ප්‍රාග්ධන උපකරණ නවතා දැමීම.

ඇ. ඉහත ආර්ථිකයේ ඵලදායිතා පරතරයක් පැවැතීම

ඉ. ආර්ථිකය දිගු කාලීන ආර්ථික පරිහාණියට මුහුණ දීම.

ඊ. ආර්ථිකය ජනවාර්ගික හා ගෝත්‍රික වශයෙන් වෙනස්කම් දක්නට ලැබීම.

(1 x 5 = 05)

iii. පහත සඳහන් වන්නේ වැඩෙන ආවස්ථික පිරිවැය යටතේ පූර්ණ සේවා නියුක්තව සහ උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව ආහාර සහ ඖෂධ නිෂ්පාදනය කරන ආර්ථිකයකි. එම ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට අදාල දත්ත පහත දක් වේ.
(ඖෂධ හා ආහාර ඒකක මිලියන වලින්)

| ඖෂධ | ආහාර |
|---|---|
| 0 | 30 |
| 1 | 28 |
| 2 | 24 |
| 3 | 18 |
| 4 | 10 |
| 5 | 0 |

අ. ඉහත නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට අදල දත්ත උපයෝග කරගෙන සම්පත් බෙදහැරීමේ කාර්යක්ෂමතාවය නිරූපනය කරන ප්‍රසස්ථ සංයෝග ලක්ෂය ආන්තික පිරිවැය හා ආන්තික ප්‍රතිලාභ ඇසුරින් ගණනය කරන්න.

(මෙහිදි ඖෂධ ඒකකයකට ආහාර ආන්තික පිරිවැය හා ප්‍රතිලාභ මත පදනම්ව ගණනය කරන්න.)

(ලකුණු 03)

ආ. සම්පත් බෙදහැරීමේ කාර්යක්ෂමතාවයට අනුරූප වන නිෂ්පාදන කාර්යක්ෂමතා ලක්ෂය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මගින් සොයන්න.

(ලකුණු 03)

2) i. ආර්ථික පද්ධතියක් තුල දක්නට ලැබෙන විවිධ ආයතනික ලක්ෂණ සඳහන් කරන්න.

(ලකුණු 03)

ii. ආර්ථික පද්ධති පරිණාමය වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii. වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක ආර්ථික ඒකකයන්හි හැසිරීම් තිරණය කරන මූලික බලවේග පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iv. ලාභ උපරිම කිරිමේ අරමුණින් ක්‍රියාත්මක සේවා යෝජකයකු සාධක සේවා නියුක්තිය පිළිබඳ තිරණ ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

3) i. සතියක් තුල විවිධ මිල ගණන් යටතේ දෙඩම් ඉල්ලුම් ප්‍රමාණයන් සම්බන්ධයෙන් හා සැපයුම් ප්‍රමාණයන් සම්බන්ධ ඉල්ලුම් හා සැපයුම් සමිකරණ පහත දක් වේ.

$$Q_d = 24 - 2P$$
$$Q_s = 2P$$

අ. දෙඩම්වල සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න. (ලකුණු 02)

ආ. ගැණුම්කරුවන් මත රු. 2/= ක ඒකක බද්දක් පනවනු ලැබුව හොත් නව සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 03)

ii. ගැණුම්කරුවා මත ඒකක බද්දක් පැනවූ පසු ගැණුම්කරුවන් ගෙවන මිල හා විකුණුම් කරුවන් ලබන මිල සොයන්න.

(ලකුණු 03)

iii. ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් අතර බදු බර බෙදියන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 03)

iv. ගැණුම්කරුවන් මත බදු පැනවීම නිසා ඇතිවන ආර්ථික අකාර්යක්ෂමතාවය හා සමාජ පිරිවැය පැහැදිලි කරන්න. (ලකුණු 04)

4) පූර්ණ තරගාකාරී වෙළඳ පොලක අලෙවින භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$Q_d = 96 - 8P$

$Q_s = 12 + 4P$

ඉහත භාණ්ඩය සම්බන්ධයෙන් නිෂ්පාදකයාට සහතික මිලක් ලබාදීම සඳහා අවම මිල ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරිමට රජය තිරණය කර ඇත. ඒ අනුව අතිරික්ත සැපයුම රජය මිලදී ගැනිමට රජය තීරණය කර ඇත.

අවම මිල ප්‍රතිපත්තිය යටතේ රජය රු. 10/= සහතික මිලක් තිරණය කර ඇත.

අ. සහතික මිල යටතේ පාරිභෝගික අතිරක්තයේ වෙනස ගණනය කරන්න.

ආ. සහතික මිල යටතේ නිෂ්පාදන අතිරික්තයේ වෙනස ගණනය කරන්න.

ඇ. සමස්ථ සුභසාධනයේ වෙනස ගණනය කරන්න.

ii. ඉල්ලුම් න්‍යාය හා ඉල්ලුම් නීතිය අතර වෙනස පැහැදිලි කරන්න.

iii. භාණ්ඩයක මිල සහ සපයනු ලබන ප්‍රමාණය අතර ඇති සම්බන්ධතාවයේ ස්වරූපය සැපයුම් නිතියෙන් ප්‍රකාශ කෙරේ. සැපයුම් නිතිය කෙරේ බලපාන සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 03)

iv. භාහිරතා අවම කිරීම සඳහා බදු පැනවිම සහ සහනාධාර ලබාදීම හැර රජයට ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

(ලකුණු 03)

## "ආ කොටස"

5) එක්තරා ආර්ථිකයක් සම්බන්ධ ජාතික ගිණුම් පිළිබඳ තොරතුර ඔබට සපයා ඇත.

| | |
|---|---|
| කෘෂි අංශයේ නිමැවුම රු. මිලියන | 8000 |
| කාර්මික අංශයේ නැමැවුම රු. මිලියන | 2000 |
| සේවා අංශයේ නිමැවැමු රු. මිලියන | 12,000 |
| කෘෂි අංශයේ නිමැවුම සඳහා කාර්මික අංශයෙන් මිලට ගත් වටිනාකම රු. මිලියන | 200 |
| කාර්මික අංශයේ නිමැවුම සඳහා කෘෂි අංශයෙන් මිලට ගත් වටිනාක රු. මිලියන | 400 |
| රජයේ පරිභෝජනය රු. මිලියන | 4600 |
| පෞද්ගලික පරිභෝජනය රු. මිලියන | 10,000 |
| දළ දේශිය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය රු. සි | 4000 |
| තොග වෙනස්වීම් රු. මිලියන | 2000 |
| ආනයන රු. මිලියන | 3200 |
| අපනයන රු. මිලියන | 4000 |
| විදේශ සාධක ආදයම් ලැබීම් රු. මිලියන | 800 |
| විදේශ සාධක ආදයම් ගෙවීම් රු. මිලියන | 900 |
| ශුද්ධ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය රු. මිලියන | 3800 |
| ශුද්ධ විදේශ සංක්‍රාම රු. මිලියන | 2000 |

අ. දළ දේශිය නිෂ්පාදනය ගණනය කරන්න.

ආ. දළ ජාතික නිෂ්පාදනය ගණනය කරන්න.

ඇ. වැයම්කළ හැකි දළ ජාතික ආදයම ගණනය කරන්න.

ඉ. වර්තන ගිණුමේ ශේෂය ගණනය කරන්න.

ඊ. ජාතික ඉතුරුම් ගණනය කරන්න.

(ලකුණු 2 x5 =10)

ii. දළ දේශිය නිමැවුම් ප්‍රවේශයේ පවතින දුර්වලතා පැහැදිලි කරන්න.

(ලකුණු 03)

iii. දළ දේශිය නැමැවුම තුල අන්තර්ගත වන්නේ වෙළෙඳපොළ තුල පිළිඹිබු වන ආර්ථික කටයුතු පමණි. පැහැදිලි කරන්න.

(ලකුණු 02)

6) එක්තරා ආර්ථිකයක ජාතික ගිණුම් සම්බන්ධ තොරතුරු පහත දැක් වේ.

| | |
|---|---|
| පරිභෝජනය | C = 40 + 0.6 yd |
| ආයෝජනය | I = 150 |
| රජයේ වියදම | G = 200 |
| අපනයන | X = 70 |
| ආනයන | M = 44 + 0. 28y |
| සංක්‍රාම වියදම | Tr = 40 |
| අදයම් බදු | T = 0.2Y |

ඉහත තොරතුරු උපයෝගිකරගෙන පහත සඳහන් දෑ ගණනය කරන්න.

i. සමතුලිත ජාතික ආදයම

ii. සමතුලිත නිමැවුමේදී වෙළඳ ශේෂය

iii. අයවැය හිඟය හෝ අතිරික්තය

iv. රජයේ ආයෝජන ගුණකය

v. රජයේ බදු අනුපාතය 5 % කින් අඩුකළේනම් සමතුලිත ජාතික ආදයම

7) පහත සඳහන් වන්නේ එක්තරා ආර්ථිකයක් සම්බන්දධව රාජ්‍ය මුල්‍ය තොරතුරු වේ.
(රු. මිලියන වලිනි)

| | |
|---|---|
| බදු නොවන ආදයම | 500 |
| පොලී ගෙවීම් | 900 |
| වර්තන පැවරුම් | 850 |
| බදු ආදයම | 2000 |
| භාණ්ඩ හා සේවා මත වර්තන වියදම | 1000 |
| ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණය දීම | 250 |
| විදේශ ණය | 150 |
| මහ බැංකුවෙන් ලබා ගත් ණය | 50 |
| වාණිජ බැංකු වලින් ලබා ගත් ණය | 200 |
| බැංකු නොවන මුලාශ්‍ර වලින් ලබා ගත් ණය | 100 |

ඉහත තොරතුරු උපයෝගි කරගෙන පහත දෑ හි අගය ගණනය කරන්න.

a. වර්තන ගිනුමේ ශේෂය (ල. 02)
b. සමස්ථ අයවැය ශේෂය (ල. 02)
c. මූලික ගිනුමේ ශේෂය (ල. 02)
d. සමස්ථ අයවැය හිඟය පියවෙන ආකාරය දක්වන්න. (ල. 02)
e. අයවැය හිඟය පියවීමට යොදාගන්නා මූලාශ්‍ර තුලින් උද්ධමනයට වන බලපෑම පැහැදිලි කරන්න. (ල. 03)

ii. බදු පැනවීමේදී මූලධර්ම ලෙස සැලකෙන පහත දෑ කෙටියෙන් පැහැදිලි කරන්න.

a. සාධාරණත්වයේ මූලධර්මය
b. මධ්‍යස්ථවීමේ මූලධර්මය (ල. 04)

8) i. රාජ්‍ය අයවැය ලේඛණයක් හා අතුරු සම්මත ගිණුමක් අතර ඇති වෙනස්කම් පැහැදිලි කරන්න. (ල. 04)

ii. අතුරු සම්මත ගිනුමක් ඉදිරිපත් කිරීමට සිදුවන සුවිශේෂි අවස්ථා කවරේදැයි පැහැදිලි කරන්න. (ල. 03)

iii. රාජ්‍ය බඳු ආදයමේ සංවේදිතා සංගුණකය පැහැදිලි කරන්න. (ල. 03)

iv. වර්තමාන රාජ්‍ය බදු අයහාරයේ සාධනය අයහපත් වීමට බලපා ඇති හේතු පැහැදිලි කරන්න. (ල. 05)

# රාජකීය විද්‍යාලය කොළඹ 07
# Royal College – Colombo 07

## 13 වන ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය 2010 ජුනි
## Grade 13 – Final Term Test June 2010

කාලය පැය 01

# ආර්ථික විද්‍යාව II – I කොටස

**උපදෙස් :**
*** දී ඇති සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
*** එක් බහුවරණ ප්‍රශ්නයකට ඇත්තේ එක් නිවැරදි පිළිතුරක් පමණි.**
**නිවැරදි පිළිතුර තෝරා එය යටින් ඉරක් අඳින්න.**

---

1) වාණිජ බැංකු පද්ධතියක් රු. 5,000 ක සංචිතයක් හා 20% ක සංචිත අනුපාතයකට යටත්ව කටයුතු කරන්නේ නම්, වාණිජ බැංකු පද්ධතියට මැවිය හැකි උපරිම ණය ප්‍රමාණය නිවැරදිව දක්වෙන්නේ,

i. රු. 25,000 ii. රු. 5,000 iii. රු. 100,000
iv. රු. 20,000 v. රු. 15,000

2) පහත දක්වෙන දෑ අතුරින් මූල්‍ය පද්ධතියේ කොටසක් නොවන්නේ,

i. මූල්‍ය වෙළෙඳපොළ ii. මූල්‍ය උපකරණ iii. මූල්‍ය ආයතන
iv. නියාමන ආයතන v. මූර්ත වෙළෙඳපොළ

3) පහත දක්වෙන දෑ අතුරින් මූල්‍ය පද්ධතියේ කොටසක් නොවන්නේ

i. කොටස් වෙළෙඳපොළ
ii. අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ
iii. මූල්‍ය ආයතන
iv. භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ
v. අභ්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපොළ

4) මුදල් සැපයුම අඩු කිරිම සඳහා රජය,

i. රාජ්‍ය ණය සුරැකුම්පත් අලෙවි කල යුතුය
ii. වැටුප් අනුපාතය ඉහල දැමිය යුතුය
iii. සංචිත අනුපාතය පහල දැමිය යුතුය
iv. මහ බැංකු පොලී අනුපාතිකය පහල දැමිය යුතුය
v. විදේශ වෙළෙඳපොලෙන් ණය ලබා ගත යුතුය

5) උද්ධමනය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වනුයේ

i. උද්ධමනය ඉවත් කල නොහැකි නමුත් පාලනය කල හැකිය

ii. සාමාන්‍ය මිල මට්ටම් අඛණ්ඩව ඉහල යාම උද්ධමනයයි

iii. මතුපිට උද්ධමනය ප්‍රතිපත්ති සම්පාදනයට ඉතා වැදගත් වන උද්ධමන මිනුමකි

iv. මිල මට්ටමේ ඉහල යාමේ වේගය ක්‍රමයෙන් අඩුවීමේ තත්වය නිරුද්ධමනය ලෙස හැඳින් වේ.

v. වර්තමාන මුල්‍ය ප්‍රතිපත්තියේ අවසාන අරමුණක් ලෙස ආර්ථික හා මිල ස්ථායිකරණය ලෙස සැලකේ.

6) පොළි අනුපාත කොරිඩෝවේ පහල සීමාව ලෙස සැලකිය හැක්කේ

i. ප්‍රතිවිකුණුම් අනුපාතයයි
ii. ප්‍රතිමිලදී ගැනුම් අනුපාතයයි
iii. අන්තර් බැංකු ඒක්ෂණ පොලී
iv. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයයි
v. මහ බැංකු පොලී අනුපාතයයි

7) අඩුම දවශිලතාවයක් ඇති මුල්‍ය වත්කම වනුයේ

i. ඉල්ලුම් තැන්පතු
ii. භාණ්ඩාගාර බිල්පත්
iii. මුදල් වෙළෙඳපල ගිනුම්
iv. ස්ථාවර තැන්පතු
v. ඉතුරුම් තැන්පතු

8) ආරක්ෂණය යන්න සාධාරණීයකරණය කල නොහැක්කේ

i. දේශිය ලදරු කර්මාන්ත ආරක්ෂා කිරීමටයි

ii. සේවා වියුක්තිය අඩු කිරීමටයි

iii. ගෙවුම් ශේෂ අර්බුදවලින් මිදීමටයි

iv. ස්වයංපෝෂිත අර්ථක්‍රමයක් නිර්මාණය කිරීමටයි

v. ප්‍රපාතන ක්‍රියාදමයන් සඳහායි

9) සාවද්‍ය ප්‍රකාශය වනුයේ

i. පාවෙන විනිමය ක්‍රමයක් තුල සමපේක්ෂණය ප්‍රවර්ධනය වේ.

ii. ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයකදී දේශිය ව්‍යවහාර මුදල අධිතක්සේරු වීමෙන් අපනයන වල තරඟකාරීත්වය අඩුවේ.

iii. ගෙවුම් ශේෂය තුලනය කිරීමේ ස්වයංක්‍රීය යන්ත්‍රණයක් ලෙස පාවෙන විනිමය අනුපාතික ක්‍රමය ක්‍රියාත්මක වේ.

iv. මුල්‍ය බලධාරියාගේ නිත්‍ය මැදිහත්වීම පාවෙන විනිමය අනුපාතික ක්‍රමයකට තිබිය යුතුය.

v. ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ණ පාවෙන විනිමය අනුපාත ක්‍රමය ප්‍රථම වරට ස්ථාපිත කලේ වර්ෂ 2001 දීය.

10) ආනයන වල මිල ඉල්ලුම් නම්‍යතාවය 0.9 ක්ද, අපනයන වල මිල ඉල්ලුම් නම්‍යතාවය 0.6 ක්ද, වන්නේ නම්, රුපියල අවප්‍රමාණය කිරීමකදී

i. ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ හිඟය තවදුරටත් පුළුල් වේ
ii. ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ අතිරික්තය පුළුල් වේ
iii. අපනයන පරිමාව පහල යයි
iv. වාසිදයක වෙළඳ අනුපාතයක් බිහිවේ
v. ආනයන පරිමාව ඉහල යයි

11) ලෝක වෙළඳ සංවිධානයේ මූලික අරමුණක් වනුයේ

i. සාමාජික රටවල් වල දේශිය වෙළෙඳාම වැඩි දියුණු කිරීමයි
ii. සාමාජික රටවල් වලට මූල්‍ය සහන ලබා දීමයි
iii. විදේශ වෙළෙඳමක උපකාරී වන පරිදි ව්‍යවහාරික මුදල් ක්‍රමයක් ස්ථාපිත කිරීමයි
iv. ආරක්ෂණ ප්‍රතිපත්තින් සීමා කරමින් විදේශ වෙළෙඳ කටයුතු දිරිමත් කිරීම
v. ආරක්ෂණවාදී ප්‍රතිපත්ති තහවුරු කිරීම

12) ශ්‍රී ලංකා රුපියලෙහි බාහිර අගය ක්ෂය විය හැක්කේ,

i. ශ්‍රී ලංකා උද්ධමනය වේගය සෙසු රටවල් වලට සාපේක්ෂව ඉහල ගිය විටකය
ii. ශ්‍රී ලංකා රජය විදේශිය ණය ලබා ගැනිම් වැඩි කල විටයි
iii. ආනයනික භාණ්ඩ මත පනවන තීරු බදු අනුපාත ඉහල දැමීමයි
iv. ශ්‍රී ලංකා ආර්ථිකය අවපාතයකට ගොදුරු වු විටකයි
v. ශ්‍රී ලංකා රජය විදේශ ආධාර වැඩිපුර ලබා ගැනීමෙනි

13) "රන්දෙර" වැඩසටහනේ ප්‍රධාන අරමුණ වනුයේ

i. ශ්‍රී ලංකාව විදේශ වල කරනු ලබන ඍජු ආයෝජන ඉහල දැමීමයි
ii. ශ්‍රී ලංකාව තුල මූල්‍ය ස්ථායිතාවය තහවුරු කිරීමයි
iii. සමාජ ආරක්ෂණ ජාලයක් ගොඩනැගීමයි
iv. සුක්ෂම, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර නගා සිටු වීමයි
v. ශක්තිමක් හා පුළුල් යටිතල පහසුකම් ව්‍යුහයක් ගොඩ නැගිමයි

14) සංවර්ධනය මැනීම සඳහා යොදගන්නා සංයුක්ත දර්ශකයක් නොවනුයේ

i. භෞතික ජීවන තත්ව දර්ශකයි

ii. මානව දරිද්‍රතා දර්ශකය

iii. ක්‍රය ශක්ති සාම්‍යයට ගැලපූ ඒක පුද්ගල ආදායම

iv. මානව සංවර්ධන දර්ශකය

v. යහපාලනය පිළිබඳ දර්ශකය

15) මධ්‍යම මානව සංවර්ධනයක් ඇති රටවල් වර්ග කෙරෙන මානව සංවර්ධන දර්ශකයේ අගය පරාසය නිවැරදිව දැක්වෙනුයේ

i. 0.101 0. 800 ii. 0.499 1.000 iii. 0.8 0. 1000

iv. 0.500 0. 600 v. 0.500 0.799

16) වර්තමාන ශ්‍රී ලංකීය ශ්‍රම බලකායේ ප්‍රමාණය දශ ලක්ෂ

i. 5 ii. 7 iii. 7.5

iv. 8 v. 8.5

17) රජයේ වර්තමාන ණය සේවා කරන අනුපාතය දළ දේශිය නිශ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආසන්න වශයෙන් දැක්වූ විට,

i. 11 13 % ii. 13 15 % iii. 15 17 % iv. 17 20 % v. 20 25%

18) සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

i. දකුණු ආසියානු කලාපය තුල විශාලතම සමාජ සංරක්ෂණ වැඩ සටහන් ජාලය ක්‍රියාත්මක කරන රට ශ්‍රී ලංකාවයි.

ii. විදේශ විනිමය පාලනය, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිත කාර්යයකි

iii. ප්‍රති මිලදී ගැනුම් හා ප්‍රති විකුණුම් කටයුතු හේතුවෙන් විවට වෙළඳපල කටයුතු ප්‍රසාරණය විය.

iv. සංචිත අනුපාත අවශ්‍යතාවය පහල දැමීමෙන් ප්‍රසාරණාත්මක මුල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වීමේ හැකියාව ඉහල යයි.

v. වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතයන් ක්‍රමයෙන් ඉහල යාමේ උපනතියක් පෙන්වයි.

19) 2008 වර්ෂයේදී කෘෂි, කාර්මික හා සේවා අංශවල නිමැවුමෙහි ආංශික සංයුතිය පිළිවෙලින් නිවැරදිව දක්වෙනුයේ සේවා

| | කෘෂිකාර්මික | කාර්මික | සේවා |
|---|---|---|---|
| i. | 12.1 | 28.4 | 59.5 |
| ii. | 11 | 29 | 60 |
| iii. | 15.3 | 29.7 | 55 |
| iv. | 11.8 | 32 | 57.2 |
| v. | 13 | 17 | 70 |

20) 2008 වසරේදී කෘෂි, කාර්මික හා සේවා අංශ වල සේවා නියුක්තියේ සාපේක්ෂ දයකත්වය නිවැරදිව ප්‍රකාශ වනුයේ

| | කෘෂිකාර්මික | කාර්මික | සේවා |
|---|---|---|---|
| i. | 25.2 | 35 | 49.8 |
| ii. | 31.3 | 29.7 | 40 |
| iii. | 33.2 | 31.3 | 35.5 |
| iv. | 32.7 | 26.3 | 41 |
| v. | 34.1 | 40.1 | 25.8 |